**මාධ්‍ය නිවේදනය**

**2018 ඔක්තෝබර් 18, කොළඹදී...**

Good Food, Good Life

# මයිලෝ මවුන්ටන් බයිසිකල් 1,000ක් පිරිනැමීමේ ප්‍රවර්ධන වැඩසටහනින් පොඩිත්තන්ට සහ පවුලේ සාමාජිකයන්ට ක්‍රියාශීලී ජීවන රටාවක් ගොඩනගාගැනීමට නැවත අවස්ථාව උදාකරයි

මයිලෝ රසවිඳින පොඩිත්තන්ට හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට ක්‍රියාශීලී දිවිපෙවෙතක් පවත්වාගැනීමේ වැදගත්කම පෙන්වාදෙමින් ළමුන් 1,000කට මයිලෝ මවුන්ටන් බයිසිකල් ලබාදීමේ ප්‍රවර්ධන තරගය මේ වන විට ආරම්භ වී තිබේ. මෙම තරගයට සහභාගී වීම සඳහා කළ යුත්තේ සෑම මයිලෝ RTD (Ready-To-Drink) පැකට්ටුවක් මිලදී ගන්නා විට හිමිවන සූරන පත ලබාගෙන එහි ඇති රහස් අංකය ඕනෑම ජංගම දුරකථන ජාලයක් ඔස්සේ MB<space>Code<space>Name<space>Age සඳහන් කර 6456ට කෙටි පණිවුඩයක් (sms) එවීම පමණි. ප්‍රවර්ධන තරගය 2018 නොවැම්බර් 30 වැනිදා දක්වා ක්‍රියාත්මක වන අතර සෑම දෙසතියකට වරක්ම කුසපත් ඇදීමකින් ජයග්‍රාහකයින් තෝරාගනු ලැබේ. ජයග්‍රාහී බයිසිකල් හිමිකරුවන්ට අවසානයේදී පැවැත්වෙන මහා බයිසිකල් සවාරියට එක්වෙමින් තම පවුලේ සාමාජිකයින් ද සමඟ කොළඹ වීථි ඔස්සේ තම බයිසිකලය පැදයෑමේ අවස්ථාව ද හිමිවේ.

මේ පිළිබඳව අදහස් දක්වමින් අදාළ අංශ අලෙවි කළමනාකරු මොහොමඩ් අලි මහතා මෙසේ පැවසීය. "මයිලෝ නිරතුරුව ජයග්‍රහණය කරා යන ගමනට ජයගන්වන දිරිය (fuelling the winning spirit) යන තේමාව පෙරදැරිව සෞඛ්‍යමත් හා ක්‍රියාශීලී ජීවන රටාවකට ළමුන් හුරුකරවීමට කටයුතු කරනවා. ඒ අනුව විනෝදයත් කැටි කරගත් ක්‍රියාශීලීත්වයක් ළමුන්ට සමීප කරවන ක්‍රියාකාරකමක් ලෙස බයිසිකල් පැදීම ඔවුන්ට හුරු කරවීම අපගේ අරමුණයි. බයිසිකල් පැදීම කියන්නේ කේවළ ක්‍රියාකාරකමක් වගේම කණ්ඩායම් ක්‍රියාකාරකමක්. ඒ නිසා නව මිතුරන් ඇති කරගැනීමටත්, ඒ ඒ පවුල් අතර හිතවත්කම් ඇතිකරගැනීමටත් මේ හරහා හැකිවෙනවා. කණ්ඩායම් හැඟීම සහ සුහද තරගකාරීත්වයත් මේ තුළින් ඇතිකරවනවා. මේ මයිලෝ මවුන්ටන් බයිසිකල් පිරිනමන අඛණ්ඩ සිව්වැනි වර්ෂයයි. ඉකුත් වර්ෂ හා සැසඳීමේදී මේ වසරේදීත් වාර්තාගත කුසපත් ප්‍රමාණයක් අපට ලැබෙනු ඇතැයි බලාපොරොත්තුවෙනවා. අනෙක් අතට මේ ප්‍රවර්ධනය වැඩසටහනේ ජනප්‍රියත්වය තුළින් පිළිබිඹු වන්නේ මයිලෝ සන්නාමය කෙරෙහි පාරිභෝගිකයන් තුළ ඇති විශ්වාසය සහ ආදරය යි. දැනට ක්‍රියාත්මක ප්‍රවර්ධන වැඩසටහනේ අවසානයත් සමඟ අපි මේ දක්වා මයිලෝ රසවිඳින පොඩිත්තන් 4,000කට මවුන්ටන් බයිසිකල් පිරිනමා තිබීමත් විශේෂත්වයක්"

නෙස්ලේ සතු ලොව ප්‍රමුඛතම චොකලට් මෝල්ට් පානය වන මයිලෝ, විටමින් හා ඛනිජ ලවණ ගුණයෙන් පරිපූර්ණය. මයිලෝ නිෂ්පාදනය කෙරෙන්නේ දහස් ගණනක දේශීය කිරි ගොවීන්ගෙන් ලබාගන්නා නැවුම් එළකිරිවලට, මෝල්ට් පෝෂණය හා උසස්ම කොකෝවා එක්කරමිනි. ජයග්‍රහණය කරා යන ගමනට ජයගන්වන දිරිය (Fuelling the

Winning Spirit) ලබාදෙන මයිලෝ, දශක තුනක් මුළුල්ලේ ලොකු කුඩා භේදයකින් තොරව මෙරට පාසල් ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් ද කැපවී හිඳී. පාරිභෝගිකයන් සාර්ථකත්වය කරා යන ගමනට අවශ්‍ය ශක්තිය ලබාදෙන මයිලෝ, මෙරට ළමුන් සිය දහස් ගණනකට ශාරීරිකව සක්‍රීය වීමට මෙන්ම අනාගතයේ ක්‍රීඩා තරු ලෙසින් බැබලීමටත් මඟ විවර කරදී තිබේ.